## දළ ජාතික නිෂ්පාදිතය, ආදායම හා වියදම

### සමස්ත උපනතීන්

මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ (ද. දේ. නි.) වර්ධනය අනුව මැන බලනවිට ශ්‍රී ලංකා ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය පෙර වසරට වඩා 1984 දී මඳ දියුණුවක් පෙන්නුම් කරයි. 1983 දී සියයට 5.0 ක වර්ධනය හා සසඳා බලනවිට මෙම වසරෙහි මූර්ත ද. දේ. නි. සියයට 5.1 කින් පමණ වර්ධනය වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මූර්ත වශයෙන් බලන කල පිටත ගලා ගිය ශුද්ධ සාධක ආදායම් ප්‍රමාණය අඩු වීම 1984 දී වූ හිතකර සිදු වීමක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 1983 දී සියයට 4.1 ක වැඩි වීමක් දැක්වූ මූර්ත දළ ජාතික නිෂ්පාදිතය (ද. ජා. නි.) මෙම වසරේදී සියයට 5.3 කින් වැඩි විය.

පවත්නා සාධක වියදම් මිළ යටතේ දළ ජාතික නිෂ්පාදිතය රුපියල් 13,500 කෝටියක් වශයෙන් ගණනය කර ඇත. මෙය 1983 සමග බලන විට සියයට 24 ක වැඩි වීමකි. ද. ජා. නි. මූර්ත වැඩි වීම ගැන සැළකූ විට ආරෝපිත ද. ජා. නි. ගැලපුම් සියයට 17.8 කින් පමණ වැඩි වේ යැයි ඇස්තමේන්තු කර තිබේ. මෙම වැඩි වීමට මූලික වශයෙන් බලපා ඇත්තේ, විශේෂයෙන් තේ හා රබර් ඇතුළු කෘෂි අපනයන මිළ ගණන්වල ඇති වූ වැඩි වීමයි.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් සපයන ලද දත්තවලට අනුව 1984 දී ශ්‍රී ලංකාවේ මැදි වසර ජනගහණය එක් කෝටි 56 ලක්ෂයක් වශයෙන් තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. එය 1983 ට වඩා සියයට 1.2 ක වැඩි වීමකි. එමනිසා, ඒක පුද්ගල ද. ජා නි. රුපියල් 8,643 ක් (එ. ජ. ඩොලර් 340) වශයෙන් ගණනය කර ඇත. 1983 දී සියයට 2.5 ක වර්ධනය හා සසඳන කල්හි ඒක පුද්ගල ආදායමේ මූර්ත වැඩි වීම සියයට 4 ක් ලෙස දක්වේ.

පසුගිය වසරේදී සියයට 16 ක වැඩි දියුණුවක් පෙන්නුම් කළ ශ්‍රී ලංකාවේ වෙළෙඳ අනුපාතය, 1984 දී තවදුරටත් සියයට 14 ක දියුණුවක් දක්වා ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් වෙළෙඳ අනුපාතයේ වෙනස්වීම් සඳහා ගලපන ලද මූර්ත ද. ජා. නි. හෙවත් මූර්ත ජාතික ආදායම සියයට 7.6 කින් වැඩි වී තිබේ. පසුගිය වසරේදී එහි වර්ධනය සියයට 5.9 ක් විය. තේ අපනයනය මගින් ලද වාසිදායක තත්ත්වය මෙන්ම විශේෂයෙන්, ඛනිජ තෙල් හා සීනි ඇතුළු ප්‍රධාන ආනයනයන්ගේ මිළ ගණන් අඩු වීමද 1984 දී මූර්ත ජාතික ආදායම වැඩි වීම තුළින් පිළිබිඹු විය.

ද. ජා. නි. මූර්ත වර්ධනය සඳහා පසුගිය වසරවලදී ප්‍රධාන බලපෑමක් දක්වන ලද්දේ කෘෂිකාර්මික අංශයෙහි වූ ක්‍රියාකාරිත්වයයි. එහෙත්, 1984 දී එම තත්ත්වය වෙනස් කරමින් ආර්ථික වර්ධනය උදෙසා මූලික වශයෙන් දායක වූ අංග ලෙස නිමැවුම් කර්මාන්ත සහ තොග හා සිල්ලර වෙළෙඳ අංශ ඉස්මතු වෙයි. ඒ අතරම, කෘෂිකර්මය හා ප්‍රවාහන යන අංශද එම වර්ධනය සඳහා සැළකිය යුතු අන්දමින් සම්බන්ධ වී ඇත. 1984 දී තැනීම් කටයුතුවල අඩු වීමක් දක්නට ලැබුණි.

### ආංශීය ක්‍රියාකාරිත්වය

1982–1984 කාල පරිච්ඡේදය සඳහා වූ ආංශීය වර්ධන අනුපාතිකයන් 1.7 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. පසුගිය වසරට වඩා 1984 දී කෘෂිකර්මය, දව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය යන අංශය සියයට 2.2 කින් වර්ධනය විය. තේ උප අංශය මගින් වූ එකතු කළ වටිනාකම සියයට 16.1 කින් වැඩි වූ අතර, රබර් උප අංශය සියයට 1.5 කින් වර්ධනය විය. දේශීය කෘෂිකර්මය, විශේෂයෙන් වී උප අංශය පසුගිය කාලයේදී වඩා ගතික ස්වභාවයක් දක්විය. කෙසේ වුවද, 1984 දී වී අස්වැන්නෙන් සෑහෙන කොටසක් ගංවතුර නිසා විනාශ විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් වී නිමැවුම සියයට 2.4 කින් අඩු විය.

## 1 . 7 සංඛ්‍යා සටහන

### ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සහ වර්ධනය 1982—1984

| අංශය | වටිනාකම (රු. දශ ලක්ෂ) | | | ද.ජා.නි. හි ප්‍රතිශතයක් වශයෙන් | | | පසුගිය වසරට වඩා වැඩිවීම (රු. දශ ලක්ෂ) | | ද. ජා. නි. වැඩිවීමේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1982(අ) | 1983(අ) | 1984(අ) | 1982(අ) | 1983(අ) | 1984(අ) | 1983 | 1984 | 1983 | 1984 |
| 1. කෘෂිකර්මය, දැව ආදී වන ද්‍රව්‍ය හා ධීවරකර්මාන්තය | 24,964 | 26,294 | 26,866 | 27·4 | 27·7 | 26·9 | 1,330 | 572 | 35·7 | 11·5 |
| 1·1 කෘෂිකර්මය | 20,771 | 21,867 | 22,351 | 22·8 | 23·1 | 22·4 | 1,096 | 484 | 29·5 | 9·7 |
| 1·1·1 තේ | 2,418 | 2,309 | 2,681 | 2·7 | 2·4 | 2·7 | – 109 | 372 | – 2·9 | 7·5 |
| 1·1·2 රබර් | 770 | 865 | 878 | 0·8 | 0·9 | 0·9 | 95 | 13 | 2·5 | 0·3 |
| 1·1·3 පොල් | 3,263 | 2,992 | 2,564 | 3·6 | 3·2 | 2·6 | – 271 | – 428 | – 7·2 | – 8·6 |
| 1·1·4 වී | 5,484 | 6,318 | 6,166 | 6·0 | 6·7 | 6·2 | 834 | – 152 | 22·4 | – 3·1 |
| 1·1·5 අනෙකුත් | 8,836 | 9,383 | 10,062 | 9·7 | 9·9 | 10·0 | 547 | 679 | 14·7 | 13·6 |
| 1·2 දැව ආදී වන ද්‍රව්‍ය | 1,710 | 1,816 | 1,889 | 1·9 | 1·9 | 1·9 | 106 | 73 | 2·8 | 1·5 |
| 1·3 ධීවර කර්මාන්තය | 2,483 | 2,611 | 2,626 | 2·7 | 2·7 | 2·6 | 128 | 15 | 3.4 | 0.3 |
| 2. පතල් හා කැනීම් කටයුතු | 2,238 | 2,413 | 2,449 | 2·5 | 2·5 | 2·5 | 175 | 36 | 4·7 | 0·7 |
| 3. නිමැවුම් කර්මාන්තය | 13,601 | 13,710 | 15,390 | 14·9 | 14·4 | 15.4 | 109 | 1,680 | 2·9 | 33·7 |
| 3·1 අපනයන සැකසීම | 2,846 | 2,715 | 2,983 | 3·1 | 2·8 | 3·0 | – 131 | 268 | – 3·5 | 5·4 |
| 3·2 කර්මාන්ත නිෂ්පාදන | 8,777 | 8,953 | 10,296 | 9·6 | 9.4 | 10.3 | 176 | 1,343 | 4·7 | 26.9 |
| 3·3 කුඩා හා අනෙකුත් කර්මාන්ත | 1,978 | 2,042 | 2,111 | 2·2 | 2·2 | 2·1 | 64 | 69 | 1·7 | 1.4 |
| 4. කැනීම් | 7,959 | 8,039 | 8,030 | 8·7 | 8·4 | 8.0 | 80 | – 9 | 2.2 | – 0.2 |
| 5. විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා | 1,089 | 1,161 | 1,196 | 1·2 | 1·2 | 1·2 | 72 | 35 | 1·9 | 0.7 |
| 6. ප්‍රවාහනය, ගබඩාකිරීම හා පණිවුඩ හුවමාරුව | 10,666 | 11,146 | 11,759 | 11·7 | 11·8 | 11.8 | 480 | 613 | 12·9 | 12.3 |
| 7. තොග සහ සිල්ලර වෙළෙඳාම | 19,694 | 20,738 | 22,029 | 21·5 | 21·9 | 22·0 | 1,044 | 1,291 | 28·0 | 25.9 |
| 7·1 ආනයන | 8,812 | 8,981 | 9,161 | 9·6 | 9·5 | 9.2 | 169 | 180 | 4.5 | 3.6 |
| 7·2 අපනයන | 2,018 | 1,964 | 2,194 | 2·2 | 2·1 | 2·2 | – 54 | 230 | – 1·4 | 4·6 |
| 7·3 දේශීය | 8,864 | 9,793 | 10,674 | 9·7 | 10·3 | 10·6 | 929 | 881 | 24.9 | 17·7 |
| 8. බැංකු, රක්ෂණය සහ නිශ්චල දේපල | 2,230 | 2,707 | 3,005 | 2·4 | 2·9 | 3.0 | 477 | 298 | 12.8 | 6·0 |
| 9. නිවාස අයිතිය | 3,250 | 3,315 | 3,381 | 3·6 | 3·5 | 3·4 | 65 | 66 | 1·7 | 1.3 |
| 10. රාජ්‍ය පරිපාලනය සහ ආරක්ෂක කටයුතු | 2,899 | 3,786 | 4,165 | 3·2 | 4.0 | 4.2 | 887 | 379 | 23.8 | 7.6 |
| 11. සේවා (අන්තැනක සඳහන් නොවන) | 4,604 | 4,590 | 4,636 | 5.0 | 4·8 | 4·6 | – 14 | 46 | – 0.4 | 0·9 |
| 12. දළ දේශීය නිෂ්පාදිතය | 93,194 | 97,899 | 1,02,906 | 102.1 | 103·1 | 103.0 | 4,705 | 5,007 | 126·2 | 100·4 |
| 13. විදේශීය ශුද්ධ සාධක ආදයම | - 1,959 | - 2,936 | - 2,957 | – 2·1 | – 3.1 | – 3·0 | – 977 | – 21 | - 26·2 | – 0.4 |
| 14. දළ ජාතික නිෂ්පාදිතය | 91,235 | 94,963 | 99,949 | 100·0 | 100·0 | 100·0 | 3,728 | 4,986 | 100.0 | 100.0 |

අ. තාවකාලිකයි

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

පසුගිය තෙවසර තුළදීම පහළ බැසීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කළ වැවිලි කෘෂිකාර්මික අංශයේ තේ නිෂ්පාදනය 1984 දී සියයට 16.1 ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. රබර් නිෂ්පාදනය 1984 දී වර්ධනය වී ඇත්තේ සුළු වශයෙනි. පොල් උප අංශය තවදුරටත් පහළ බැසීමක් පෙන්නුම් කර ඇත. 1984 දී එම අංශයේ එකතු කළ වටිනාකම සියයට 14.3 ක අඩු වීමක් සටහන් කර තිබේ. වසරේ පසු භාගයේදී දිවයිනේ උතුරුකරයේ වෙරළාසන්න හා ගැඹුරු මුහුදේ මසුන් මැරීමේ කටයුතු වලට ඇතිවූ බාධක නිසා ධීවර කටයුතු අංශයේ දක්නට ලැබුණේ සුළු වර්ධනයක් පමණි.

1983 දී සියයට 0.8 ක සුළු මට්ටමක වර්ධනයක් පෙන්නුම් කළ නිෂ්පාදන කර්මාන්ත අංශය සමස්තයක් වශයෙන් ගෙන බලනවිට 1984 දී සියයට 12.3 ක වර්ධනයක් දක්වා ඇත. අපනයන කෘෂි සැකසුමෙහි එකතු කළ වටිනාකම සියයට 9.9 කින් වැඩි විය. පසුගිය වසරේ සියයට 2 ක වැඩි වීම හා සසඳා බලන කල කර්මාන්ත නිෂ්පාදනයන්හි එකතු කළ වටිනාකම මෙම වසරේදී සියයට 15 ක වැඩි වීමක් දක්වයි. රාජ්‍ය අංශයේ කර්මාන්තයන් සියයට 7 කින් වැඩි දියුණු වූ අතර, පෞද්ගලික අංශයේ කර්මාන්ත සියයට 26 ක මට්ටමකින් වර්ධනය විය. 1984 දී කුඩා කර්මාන්ත උප අංශය සියයට 4 ක වැඩි වීමක් දක්වා ඇත.

1984 දී තැනීම් කටයුතු අංශයේ සුළු අඩු වීමක් විය. පෞද්ගලික අංශයේ ගොඩනැගිලි තැනීම් කටයුතුවල ක්‍රියාකාරිත්වය මෙම වසරේදී තවදුරටත් අඩු විය. 1984 දී කොළඹ මහ නගර සභාව මගින් අනුමත කරන ලද ගොඩනැගිලි සැළසුම් ප්‍රමාණය සියයට 20 කින් අඩු වී ඇත. රාජ්‍ය අංශයේ තැනීම් කටයුතුවල යම් අඩු වීමක් දක්නට විය. මීට හේතු වූයේ, කඩිනම් මහවැලි වැඩපිළිවෙල යටතේ ප්‍රධාන ව්‍යාපෘතීන් දෙකක (කොත්මලේ හා රන්දෙනිගල) පමණක් තැනීම් කටයුතු නොකඩවා ඉහළ මට්ටමක පැවතීමයි. වික්ටෝරියා වේල්ල සහ මිනිපේ දකුණු ඇළ ඉවුර හා ද්‍රෝණියේ තැනීම් කටයුතු සම්පූර්ණ කර ඇත.

විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා අංශයේ එකතු කළ වටිනාකම 1984 දී සියයට 3 කින් වැඩි වී තිබේ. පෙර වසර හා සසඳන කළ මෙම වසරේදී විදුලිබල උත්පාදනයේ වර්ධනය සියයට 6.9 කි.

පසුගිය වසරේදී සියයට 4.5 ක වර්ධනය හා සසඳන විට ප්‍රවාහනය, ගබඩා කිරීම හා පණිවුඩ හුවමාරු අංශය 1984 දී සියයට 5.5 කින් වර්ධනය විය. රාජ්‍ය අංශයේ ප්‍රවාහන සේවාවන් මගින් ජනනය කළ ආදයමහි අඩු වීමක් 1984 දී දක්නට ලැබුණද, එම අඩු වීම මැකී යන ප්‍රමාණයටත් වඩා වැඩියෙන් පෞද්ගලික ප්‍රවාහන සේවාවන්හි එකතු කළ අගය ව්‍යාප්ත විය. ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් මෙහෙයවන ලද භාණ්ඩ පරිමාව 1984 දී සියයට 13 කින් වැඩි වී තිබේ.

තොග සහ සිල්ලර වෙළෙඳ අංශය 1984 දී සියයට 6.2 කින් වර්ධනය විය. 1983 දී එම අංශයේ වර්ධනය සියයට 5.3 කි. අපනයන වෙළෙඳ අංශයේ එකතු කළ වටිනාකම සියයට 11.7 කින් වැඩි වූ අතර, දේශීය වෙළෙඳ අංශයේ එකතු කළ වටිනාකම වැඩි වූයේ සියයට 9 කිනි. ආනයන වෙළෙඳ අංශයේ එකතු කළ වටිනාකම සුළු වශයෙන් වැඩි විය. බැංකු කටයුතු, රක්ෂණ සහ නිශ්චල දේපල අංශය මගින් ඉපැයුණු ආදයම පෙර වසරේදී සියයට 21.4 ක වර්ධනයක් පෙන්නුම් කළ අතර, 1984 දී සියයට 11 ක වර්ධනයක් දක්වා ඇත.

නිවාස අයිතිය අංශයෙහි එකතු කළ වටිනාකම වැඩි වී ඇත්තේ සියයට 2 කිනි. 1983 දී එකතු කළ වටිනාකමට සැලෙන වැඩි වීමකින් දායක වූ රාජ්‍ය පරිපාලන හා ආරක්ෂක කටයුතු අංශය 1984 දී තවදුරටත් සියයට 10 ක වර්ධනයක් පෙන්විය. පසුගිය වසරෙහි ඇති වූ පසුබෑමෙන් පසු අනෙකුත් සේවා අංශයට මඳ දියුණුවක් අත් කර ගැනීමට හැකි වී ඇත.

**වියදම් රටාව**

දළ දේශීය වියදමෙහි (ද. දේ. වි.) වර්ධන වේගයෙහි යම් පමණ අඩු වීමක් සිදු වී තිබේ. 1983 වසරට වඩා සියයට 14.2 ක හෝ රුපියල් 1,990 කෝටියක වැඩි වීමක් දක්වමින් දළ දේශීය වියදම 1984 දී රුපියල් 15,990 කෝටියක් විය. 1983 වසරේදී එහි වැඩි වීම රුපියල් 2,150 කෝටියක් හෝ සියයට 18 ක් විය. පෞද්ගලික පරිභෝජන වියදම සියයට 15.5 කින් වැඩි වී රුපියල් 11,030 කෝටියක මට්ටමට ළඟා වී ඇත. මෙරට නිපැයූ භාණ්ඩ සඳහා වැය වූ මුදල සියයට 20.5 කින් වැඩි වූ අතර විදේශ භාණ්ඩ සහ සාධක නොවන සේවාවන් සඳහා වැය වූ මුදල සියයට 1.6 කින් අඩු විය. රාජ්‍ය අංශයෙහි පරිභෝජන වියදම පෙර වසරට වඩා සියයට 16 කින් වැඩි විය.

තොග වෙනස්වීම්ද ඇතුළත් වන දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය පසුගිය වසරේ සියයට 19 ක වැඩිවීම හා සසඳන කල, මෙම වසරේදී සියයට 10.5 කින් වැඩි විය. පෙර වසරේ සියයට 16 ක වර්ධනය සමඟ සංසන්දනය කරන විට 1984 දී පෞද්ගලික හා රාජ්‍ය සංස්ථා යන දෙඅංශයේම ප්‍රාග්ධන සම්පාදනය සියයට 10 කින් වැඩි විය. 1983 දී සියයට 35.4 කින් වැඩි වූ රාජ්‍ය අංශයෙහි දළ ප්‍රාග්ධන සම්පාදනය, 1984 දී වැඩි වූයේ සියයට 12.6 කිනි.

1·8 සංඛ්‍යා සටහන

**ප්‍රාග්ධන වියදමෙහි ආනයනිත ප්‍රමාණය**

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1982 | 1983 | 1984 |
|---|---|---|---|
| 1. දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය .. | 30,028 | 36,273 | 39,700 |
| 2. ආනයනිත ආයෝජන භාණ්ඩ (මි.ර.ගැ. වටිනාකම) .. | 11,034 | 10,900 | 11,443 |
| 3. නැව් සහ ගුවන් යානා හැර ආනයනිත ආයෝජන භාණ්ඩ (මි.ර.ගැ. වටිනාකම) .. | 7,597 | 9,298 | 10,343 |
| 4. ආනයනිත ප්‍රමාණය (අංක 2, අංක 1 හි ප්‍රතිශතයක් ලෙස) .. | 36·7 | 30·0 | 28·8 |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව.

පසුගිය වසරේ සියයට 20.8 ක වැඩිවීමක් දක්වූ දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය, මෙම වසරේදී සියයට 9.4 ක වැඩිවීමක් පෙන්වීය. 1983 දී සියයට 1.2 ක අඩු වීමක් පෙන්නුම් කළ ආනයනිත ආයෝජන භාණ්ඩයන්හි මුළු අගය, මෙම වසරේදී සියයට 5 කින් වැඩි විය. නැව් හා ගුවන් යානා, හැර අනෙකුත් ප්‍රාග්ධන භාණ්ඩයන්හි ආනයනය, 1984 දී සියයට 11.2 කින් වැඩි විය. පසුගිය වසර තුළදී මෙහි වැඩි වීම සියයට 22.4 ක් විය. දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයෙහි අඩංගු ආනයනිත ප්‍රමාණය 1984 දී සියයට 28.8 ක් විය.

දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයෙන් සියයට 81 ක් පෞද්ගලික අංශයෙහි හා රජයේ සංස්ථාවන්හි සිදු විය. ප්‍රාග්ධන සම්පාදනයෙන් විශාලතම කොටස ගොඩනැගිලි හා අනෙකුත් තැනීම් කටයුතු සඳහාද දෙවෙනුව යන්ත්‍ර හා උපකරණ මිළදී ගැනීම සඳහාද වැය වී ඇත. 1983 දී සියයට 34 ක වර්ධනය හා සසඳන කල, පවත්නා මිළ ගණන් යටතේ ඉදි කිරීම් කටයුතුවල සිදු වූ ප්‍රාග්ධන සම්පාදනය 1984 දී සියයට 14 කින් වැඩි විය. 1984 තුළදී මහවැලි සංවර්ධන වැඩසටහනෙහි සිදු වූ ඉදි කිරීම් කටයුතුවල අගය රුපියල් 670 කෝටියක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණ හා උපකරණ ආදියෙහි ප්‍රාග්ධන සම්පාදනය පෙර වසරට වඩා වැඩි වූයේ සියයට 1 කින් පමණි. ඉඩම් සංවර්ධනය හා නැවත වගා කිරීම් නිසා වූ ප්‍රාග්ධන සම්පාදනය, පවත්නා මිළ ගණන් යටතේ සියයට 7.8 කින් පමණ වැඩි විය.

## 1 . 9 සංඛ්‍යා සටහන

## සම්පත් සංයුතිය සහ උපයෝගී කරගත් ආකාරය 1978—1984

| ශීර්ෂය | වර්තන වෙළෙඳ මිළ අනුව (රු. දශ ලක්ෂ) | | | | 1978 මිළ අනුව | | | | | | | | ප්‍රතිශතක වර්ධනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1978 | 1982(අ) | 1983(අ) | 1984(අ) | 1978 | | 1982(අ) | | 1983(අ) | | 1984(අ) | | 1982 ට වඩා 1983 | 1983 ට වඩා 1984 |
| | | | | | වටිනාකම රු. දශලක්ෂ | % | වටිනාකම රු. දශලක්ෂ | % | වටිනාකම රු. දශලක්ෂ | % | වටිනාකම රු. දශලක්ෂ | % | | |
| **1. මුළු සම්පත්** .. | **59,537** | **1,45,674** | **1,72,045** | **2,04.532** | **59,537** | **100** | **78,328** | **100** | **81,472** | **100** | **84,508** | **100** | **4·0** | **3·7** |
| 1·1 වෙළෙඳ මිළ අනුව ද.දේ.නි. .. | 42,665 | 99,769 | 1,21,664 | 1,51,575 | 42,665 | 72 | 53,355 | 68 | 56,049 | 69 | 58,907 | 70 | 5.0 | 5.1 |
| 1.2 භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන .. | 16,872 | 45,905 | 50,381 | 52,957 | 16,872 | 28 | 24,973 | 32 | 25,423 | 31 | 25,601 | 30 | 1·8 | 0·7 |
| **2. උපයෝගීකරණය** .. | **59,537** | **1,45,674** | **1,72,045** | **2,04,532** | **59,537** | **100** | **78,328** | **100** | **81.472** | **100** | **84,508** | **100** | **4·0** | **3·7** |
| 2·1 පරිභෝජනය .. | 36,148 | 88,250 | 1,03,966 | 1,20,099 | 36,148 | 61 | 48,940 | 63 | 51,074 | 63 | 51,840 | 61 | 4.4 | 1·5 |
| 2·2 ස්ථාවර දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය.. | 8,521 | 30,028 | 36,273 | 39,700 | 8,521 | 14 | 13,305 | 17 | 14,395 | 17 | 14,568 | 17 | 8.2 | 1·2 |
| 2.2.1 රජය .. | (3,077) | (4,793) | (6,659) | (7,485) | (3,077) | (5) | (3,239) | (4) | (4,049) | (5) | (4,149) | (5) | 25·0 | 2.5 |
| 2.2.2 රජයේ සංස්ථා සහ සංයුක්ත මණ්ඩල.. | (2,056) | (10,881) | (29,614) | (32,215) | (2,056) | (3) | (4,710) | (6) | (10,346) | (12) | (10,449) | (12) | 2.8 | 1.[illegible] |
| 2.2·3 පෞද්ගලික අංශය .. | (3,388) | (14,354) | | | (3,388) | (6) | (5,356) | (7) | | | | | | |
| 2·3 තොග වෙනස්වීම් .. | 33 | 248 | – 210 | 150 | 33 | — | 73 | — | – 55 | — | 36 | — | — | — |
| 2·4 භාණ්ඩ සහ සාධක නොවන සේවා අපනයන .. | 14,835 | 27,148 | 32,016 | 44,583 | 14,835 | 25 | 16,010 | 20 | 16,058 | 20 | 18,064 | 22 | 0.3 | 12.5 |

(අ) තාවකාලිකයි

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

**සම්පත් හා සම්පත් උපයෝජනය**

මෑත වසර කිහිපය තුළදී ශ්‍රී ලංකාව දේශීය සම්පත් කෙරෙහි වැඩි විශ්වාසයක් තබා ගති. ආර්ථිකයෙහි පැවති මුළු සම්පත් වලින් සියයට 74 ක්ම දේශීය නිමැවුම් මගින් නියෝජනය වීය. ඒ තුළින් 1984 දී එම උපනතිය තවදුරටත් තහවුරු වීමක් පෙන්නුම් කළේය. 1982 හා 1983 දී මෙම අනුපාතය පිළිවෙලින් සියයට 68 ක් හා සියයට 71 ක් විය. 1984 දී පවත්නා වෙළෙඳ මිළ යටතේ ශ්‍රී ලංකා ආර්ථිකයෙහි රුපියල් 20,450 කෝටියක සම්පත් ප්‍රමාණයක් පැවතිණ. මෙම ප්‍රමාණයෙන් රුපියල් 15,160 කෝටියක් දේශීය නිෂ්පාදනයෙන් ලැබුණු අතර, රුපියල් 5,300 කෝටියක් ආනයනයන් තුළින් ලැබිණ.

සම්පත් උපයෝජනයේදී රුපියල් 12,010 කෝටියක හෙවත් සියයට 58.7 ක් පරිභෝජනය සඳහාද, රුපියල් 3,980 කෝටියක හෙවත් සියයට 19.5 ක් ප්‍රාග්ධන සම්පාදනය සඳහාද යෙදවිණ. රුපියල් 4,460 කෝටියක වූ භාණ්ඩ හා සාධක නොවන සේවාවන්හි අපනයන, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 29 ක් විය. මෙය, පසුගිය වසර තුළ වූ ක්‍රියාකාරිත්වය හා සැසඳේ. 1982 හා 1983 වර්ෂවලදී සංසන්දනාත්මක ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 27 හා සියයට 26 ක් විය.

1978 ස්ථාවර මිළ ගණන් යටතේ අගයන ලද මුළු සම්පත් ප්‍රමාණය, 1984 වසරේදී සියයට 3.7 කින් වැඩි විය. 1984 දී ආනයනයන්හි ගලා ඒම සියයට 0.7 කින් වැඩි විය. 1984 දී දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සියයට 1.2 කින් වැඩි වූ අතර, මුළු පරිභෝජනය සියයට 1.5 කින් වැඩි විය. පෞද්ගලික අංශයෙහි හා රජයේ සංස්ථාවල ප්‍රාග්ධන සම්පාදනය සියයට 1 කින් වැඩි වූ අතර, රාජ්‍ය අංශයෙහි එකී වැඩි වීම සියයට 2.5 ක් විය.

**1.10 සංඛ්‍යා සටහන**

**ජාතික ඉතුරුම් 1982—1984**

**(පවත්නා වෙළෙඳ මිළ අනුව)**

රු. දශ ලක්ෂ

| ශීර්ෂය | 1982 (අ) | 1983 (අ) | 1984 (අ) |
|---|---|---|---|
| 1. වෙළෙඳ මිළ අනුව දළ දේශීය නිෂ්පාදිතය .. | 99,769 | 1,21,644 | 1,51,575 |
| 2. දේශීය ඉතුරුම් .. | 11,519 | 17,698 | 31,476 |
| 3. විදේශීය ශුද්ධ සාධක ආදයම .. | – 1,959 | – 3,214 | – 3,356 |
| 4. විදේශීය ශුද්ධ පෞද්ගලික පැවරුම් .. | 5.494 | 6,441 | 7,039 |
| 5. ජාතික ඉතුරුම් .. | 15,054 | 20,925 | 35,159 |
| 6. දේශීය ඉතුරුම් අනුපාතිකය (අංක 2, අංක 1 හි ප්‍රතිශතයක් ලෙස) .. | 11.5 | 14.5 | 20.8 |
| 7. ජාතික ඉතුරුම් අනුපාතිකය (අංක 5, අංක 1 හි ප්‍රතිශතයක් ලෙස) .. | 15.1 | 17.2 | 23.2 |

(අ) තාවකාලික.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1983 දී රුපියල් 1,770 කෝටියක් වූ දේශීය ඉතිරි කිරීම ප්‍රමාණය 1984 දී සියයට 78 ක වර්ධනයක් දක්වමින් රුපියල් 3,150 කෝටියක මට්ටමට ළඟා විය. මෑත වර්ෂයන්හිදී නිරීක්ෂණය කරන ලද ඉතිරි කිරීම්හි ඉහළතම වර්ධන අනුපාතිකය මෙය වේ. 1983 දී දේශීය ඉතිරි කිරීම් සියයට 53.6 කින් වැඩි විය. 1984 දී දළ දේශීය නිෂ්පාදිතයෙහි (වෙළෙඳ මිළ අනුව) අනුපාතයක් වශයෙන් දේශීය ඉතිරි කිරීම් සියයට 20.8 ක් විය. මෙම අනුපාත ප්‍රමාණය 1983 දී සියයට 14.5 ක්ද, 1982 දී සියයට 11.5 ක්ද විය. ශුද්ධ විදේශීය සාධක ආදයම් හා පෞද්ගලික සංක්‍රාම ගෙවීම්ද ඇතුළත් වන මුළු ජාතික ඉතිරි කිරීම්හි අගය රුපියල් 3,520 කෝටියක් විය. මෙය, පෙර වසරට වඩා සියයට 68 ක වැඩි වීමකි. 1982 දී සියයට 15.1 ක් හා 1983 දී සියයට 17.2 ක් වූ, ද. දේ. නි. හි අනුපාතයක් වශයෙන් ජාතික ඉතිරි කිරීම්, 1984 දී සියයට 23.2 දක්වා ඉහළ ගොස් ඇත.

## ශිල්පීය ක්‍රම පිළිබඳ සටහන - II කොටස

### ප්‍රතිශෝධිත ජාතික ආදයම් ඇස්තමේන්තු

දේශීය හා ජාත්‍යන්තර ආර්ථික වෙනස්කම්වල බලපෑම නිසා ශ්‍රී ලංකා ආර්ථිකයෙහි ඇති වූ ව්‍යුහාත්මක වෙනස්කම් ඵලදායී ලෙස සළකා බැලීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1983 වසරේදී ජාතික ආදයම් ගිණුම් ගණනය කිරීම සවිස්තරාත්මකව ප්‍රතිශෝධනය කිරීමේ වැඩපිළිවෙලක් දියත් කරන ලදී. මෙම අභ්‍යාසයෙහි පළමු අදියරයෙහි ප්‍රතිඵලයන් සම්බන්ධ වන (i) කෘෂිකර්මය, (ii) කෘෂි සැකසුම්, (iii) ධීවර කටයුතු, (iv) පතල් හා කැණීම් කටයුතු, (v) විදුලි බලය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා, (vi) නිවාස අයිතිය හා (vii) රාජ්‍ය පරිපාලනය යන අංශ 1983 වාර්ෂික වාර්තාව සමග ප්‍රසිද්ධියට පත් කරන ලදී. දෙවන අදියර යේදී ප්‍රතිශෝධනයට භාජනය වූයේ පහත දැක්වෙන අංශ වේ :

(viii) ප්‍රවාහනය, ගබඩා කිරීම හා පණිවුඩ හුවමාරුව.

(ix) තොග සහ සිල්ලර වෙළෙඳාම්,

(x) අනෙකුත් සේවාවන්.

දෙවන අදියරයේදී ප්‍රතිශෝධනයට ලක් වූ අංශයනට අදළ ප්‍රතිශෝධිත ජාතික ආදයම් ඇස්තමේන්තු හා පැරණි ජාතික ආදයම් ඇස්තමේන්තු අතර සැසඳීමක් 1අ. සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**1 අ. සංඛ්‍යා සටහන**

**එකතු කළ වටිනාකමෙහි ප්‍රතිශෝධිත (1982) ඇස්තමේන්තු හා පැරණි (1970) ඇස්තමේන්තු අතර සැසඳීම**

රු. දශ ලක්ෂ

| අංශය | පැරණි ඇස්තමේන්තු | නව ඇස්තමේන්තු | වෙනස්වීම |
|---|---|---|---|
| 8. ප්‍රවාහණය, ගබඩා කිරීම හා පණිවුඩ හුවමාරුව .. | 8,536 | 10,666 | +2,130 |
| 9. තොග හා සිල්ලර වෙළෙඳාම .. | 16,059 | 19,694 | +3,635 |
| 9.1 ආනයන .. .. | 4,167 | 8,812 | +4,645 |
| 9.2 අපනයන .. .. | 2,861 | 2,018 | - 843 |
| 9.3 දේශීය .. .. | 9,031 | 8,864 | - 167 |
| 10. සේවා (අන් තැනෙක සඳහන් නොවන) .. | 8,698 | 4,604 | -4,094 |
| එකතුව | 33,293 | 34,964 | + 1671 |

මෙම සටහණෙහි පළමු කොඑස 1983 ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවෙහි පළ කර ඇත.

## කෘෂිකර්මය

### තේ

1984 වර්ෂයේදී කිලෝග්‍රෑම් 20 කෝටි 80 ලක්ෂයක් වශයෙන් ගණන් බලා ඇති තේ නිෂ්පාදනය ඉකුත් වසර හා සසඳා බලන කල වැඩි වශයෙන්ම යහපත් කාලගුණ තත්ත්වයන් නිසා, කිලෝග්‍රෑම් දෙකෝටි 87 ලක්ෂයක නැතහොත් සියයට 16 ක සැළකියයුතු වැඩිවීමක් පෙන්නුම් කළේය. නිෂ්පාදනයේ මෙම වැඩිවීම සියළුම නිෂ්පාදන ප්‍රදේශයන්හි දක්නට ලැබිණි. නිරපේක්ෂ වශයෙන් සලකා බලන කල ඉහළම වැඩිවීම (එක්කෝටි 15 ලක්ෂයක්) වාර්තා වූයේ උඩරට තේ වගා ප්‍රදේශ වලිනි.